# සොකරි සංස්කෘතික පසුබිම හා ගීත ගායනය

### සොකරි කතා පුවත සැකෙවින්

දඹදිව කාසි රටේ ගුරු හාමි නම් ආඬි ගුරෙක් වාසය කරයි. රූමත් යුවතියක වූ සොකරි සරණපාවා ගන්නා ගුරුහාමිගේ මෙහෙකරුවා වූයේ පරයා නම් පුද්ගලයෙකි. ජීවනෝපාය සඳහා රටින් රට යන ඔවුන් කෙළවරදී ලක්දිවට පැමිණේ. (එහිදී මුහුදු සතක් තරණය කරන බවත් ශ්‍රීපාද ස්ථානයට ගොස් වැඳපුදාගත් බවත් සඳහන් වේ.) තඹරාවිට ගමට පැමිණෙන ඔවුන් එහි පැලක් සාදා එහි වාසය කරයි. ගුරුහාමි බත් පිසීම සඳහා හාල් ගෙනත් දී වතුර සෙවීම සඳහා ගමට යන විට කකුල බල්ලකු විසින් සපා කයි. අමාරුවෙන් ගෙදරට පැමිණ වැතිර සිටින විට ගුරුහාමි මළා යයි සිතූ පරයා සොකරිය අනාචාරයට පොළඹවා ගැනීමකට උත්සාහ කරයි. කකුල සුවපත් කිරීම සඳහා කැඳවාගන්නා වෙදරාළ සමඟ සොකරි පළා යයි. සොවින් පෙළෙන ගුරුහාමි කතරගම දෙවියන්ට කන්තලව් කොට භාරහාර ඔප්පු කළ පසු ගුරුහාමිට වෙදරාලගේ ගෙදරදී ඇය හමුවේ. මේ වන විට ඇය දරුවකු ලබා නළවමින් සිටී. (පාට වරුණ පුත පරමණ්ඩල පුත..) දරුවා සමඟ සොකරිය නැවත භාර ගන්නා ගුරුහාමි දරුවා ප්‍රේක්ෂක ජනතාව අතට පත්කරයි. අවසානයේ දේව දානයකින් සොකරිය දරුවා ප්‍රේක්ෂකයන් අතට ලබාදීමෙන්, සශ්‍රීකත්වය නැවත ජනතාවට ලබාදීම සංකේතවත් කරයි.

- සොකරි නාටකය උඩරට පළාතෙන් වන්නියෙත් සතර කෝරළේ ඇතැම් පෙදෙස්වලටත් සීමා වූවකි.
- එහි විශේෂ ලක්ෂණයක් වන්නේ අනුරූපණ මාධ්‍යයෙන් කතාවක් කීමයි.
- කණ්ඩායම් නායකයා (බෙරකරු) කිසියම් සිද්ධියක් කවියෙන් විස්තර කරන විට නළුවෝ එය අනුකරණාත්මක නැටුමෙන් රඟ දක්වති.
- ගද්‍ය සංවාද දක්නට ඇත.

- සමහර චරිත කොළපත්වලින් සාදා වෙස් මුහුණු පළඳිති.
- උඩරට ගැටබෙරය තාල වාදනය සඳහා යොදා ගනියි.
- සමහර පළාතක ඒ සඳහා දවුල භාවිත කරන අතර වන්නියේ දී උඩැක්කිය වයනු ලබයි.
- සොකරි කථාව පළාත් බඳව වෙනස් වේ.
- සොකරි නාටකයේ මුල් ස්වරූපය තවම රදා පවතින්නේ ලග්ගල, ඉළුක්කුඹුර, බදුල්ල වැනි ප්‍රදේශවලයි.
- අස්වැන්න කපා පාගා ගත් කමත සොකරි රංගනය සඳහා ඉතා යෝග්‍යය.
- කෘෂිකර්මාන්තය හා සම්බන්ධ සශ්‍රීකත්වය හා බැඳි පවතින නාටකයක් ලෙසද හැඳින්වේ.
- මෙහි කථා පුවත පත්තිනි දෙවියන් හා සම්බන්ධවයි. නැතිවූ සොකරිය සොයා ගැනීමට කතරගම දෙවියන්ගේ පිහිට ලබාගත් බවත් නාටකයේ ඇතුළත් වේ.
- ශාන්ති කර්මය ස්වරූපයෙන් සොකරි නාට්‍ය අවසානයේ දේව දානයක් පිරිනැමීමද කරනු ලැබේ.
- තනු රටා උඩරට ශාන්ති කර්ම හා සම්බන්ධ වේ.

පැවරුම -:

ඉහත දක්වා ඇති තොරතුරු ඇසුරින් පහත ප්‍රශ්ණ වලට පිළිතුරු සපයන්න

i. සොකරි රංග සම්ප්‍රදාය පවත්නා ප්‍රදේශ නම් කරන්න.

ii සොකරි රංග සම්ප්‍රදාය සඳහා යොදාගත් සංගීත භාණ්ඩ මොනවාද?

iii සොකරි රංගනය පැවැත්වීමේ අරමුණ පැහැදිලි කරන්න.

iv සොකරි රංග සම්ප්‍රදායෙහි එන චරිත මොනවාද?

v සොකරි රංග භූමිය වූයේ කෙබඳු ස්ථානයක්ද?